ශ්‍රී ලාංකීය පාසල් 21 වන සියවසේ අධ්‍යාපනය වෙත ගෙන යාම අරමුණු කර
ක්‍රියාවට නඟන මානව සම්පත් සංවර්ධන වැඩසටහන

# Human Resource Development Programme
# to take Sri Lankan Schools to 21st Century Education


**සැසිය 8 / Session 8**

**පුනරීක්ෂණය හා ප්‍රමිති පාදක ආකෘතියක් ඔස්සේ ශ්‍රී ලාංකීය පාසලට එක් ව තිබෙන පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව පිළිබඳ වැඩසටහන (Programme for Assuring the Quality of School Education) - කොටස 2**

<u>**පුනරීක්ෂණය**</u>

1. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව පිළිබඳ වැඩසටහන **තෝරා ගෙන තිබෙන ඇගයීම් ක්ෂේත්‍ර නවීකරණය සඳහා** කවර ආකාරයක සංකල්පීය රාමුවක් හඳුන්වා දිය හැකි ද?

**සංකල්පීය රාමුව (සඵලදායි පාසලක් සඳහා)**




2. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය 2014 වර්ෂයේ දී හඳුන්වා දී තිබෙන ඇගයීම් ක්ෂේත්‍ර අට **සංවර්ධනාත්මක විවේචනයකට (Constructive Criticism)** ලක් කළ හැක්කේ කෙසේ ද?
    - අදාළ සංකල්ප අතර සම්බන්ධතා පෙන්වා දෙන ඉහත ආකාරයේ සංකල්පීය රාමුවක ඇසුර ලබා ඇති බවට සාක්ෂි නොතිබීම
    - ඒ හේතුව නිසා

- **විවිධ මට්ටම් යටතට වැටෙන** ඇගයීම් ක්ෂේත්‍ර අටක් පදනම් ව සකස් ව තිබීම
- ඇතැම් වැදගත් ඇගයීම් ක්ෂේත්‍ර මගහැරී ගොස් තිබීම

3. තෝරා ගෙන ඇති ඇගයීම් ක්ෂේත්‍ර ඉදිරිපත් කරමින් එම ක්ෂේත්‍ර සංවධර්නාත්මක විවේචනයකට ලක් කළ හැක්කේ කෙසේ ද? (අධ්‍යාපන පිරිස් සතු දක්ෂතා හඳුනාගැනීම සඳහා සුදුසු ප්‍රශ්නයක්)

1. **ශිෂ්‍ය සාධනය**
2. ඉගෙනුම, ඉගැන්වීම හා **ඇගයීම**
3. **විධිමත්** විෂයමාලා කළමනාකරණය
4. විෂය සමගාමී කටයුතු
5. ශිෂ්‍ය **සුභ (ශුභ)**සාධනය
6. **නායකත්වය හා කළමනාකරණය**
7. භෞතික සම්පත් කළමනාකරණය
8. **පාසල හා ප්‍රජාව (පාසල් ප්‍රජා සම්බන්ධතා)**

කාරණය 2 - විධිමත් විෂයමාලාව ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ගුරු භූමිකාව (පාසල තුළ හා පිටත අධ්‍යාපන කළමනාකරුවන් හා අනධ්‍යයන කාය‍ර් මණ්ඩලයේ සහාය ඇති ව)

කාරණය 3 - විධිමත් විෂයමාලාව ක්‍රියාත්මක කිරීම පිළිබඳව **ඉහළින්** සිදු කරන සොයා බැලීමක්

කාරණය 6 - සියලු ම ඇගයීම් ක්ෂේත්‍ර හැසිරවීමට උදව් කරන සාධකය

කාරණය 1 - විධිමත් විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ මූලික ප්‍රතිඵලය ලෙස සැළකෙන **අපේක්ෂිත ශිෂ්‍ය චයර්ා වඩවා ගත් සිසුන්** යටතට වැටෙන එක් කාරණයක්

4. යෝජිත සංකල්පිය රාමුවට ගැලපෙන පරිදි ඉහත සංකල්ප වෙනස් කළ හැක්කේ කෙසේ ද?

1. හැකියා පූණර් කායර් මණ්ඩලය
2. ශක්තිමත් පාසල් ප්‍රජා සම්බන්ධතා
3. සංවධරිත භෞතික සම්පත්
4. **යාවත්කාලීන** වන එදිනෙදා පරිපාලන කටයුතු
5. සාථර්ක ව ක්‍රියාත්මක වන **විධිමත් විෂයමාලාව**
6. සිසු ආකෂර්ණය දිනා ගත් **සමගාමී විෂයමාලාව**
7. කාලයට අනුව නවීකරණය වන **සැඟවුණ විෂයමාලාව**
8. ප්‍රශස්ත මට්ටමට එළඹ තිබෙන ශිෂ්‍ය ශුභසාධන සේවා

**5විෂයමාලාවක සිරස් හා තිරස් සම්බන්ධතා** (Vertical and Horizontal Relationships of a Curriculum) ඔබ වෙන් කර දක්වන්නේ කෙසේ ද?

- සම්බන්ධතා ඇති වන ආකාරය අනුව
  සිරස් සම්බන්ධතා - සම්පාදිත විෂයමාලා ආශ්‍රිත හෝ පාසල ආශ්‍රිත ශ්‍රේණි අතර
  තිරස් සම්බන්ධතා - එක ම ශ්‍රේණියක් වෙනුවෙන් සැලසුම් කර තිබෙන විවිධ විෂය ආශ්‍රිත විවිධ විෂයමාලා අතර හෝ පාසලක උගන්වනු ලබන විවිධ විෂය අතර
- සිරස් හා තිරස් සම්බන්ධතා සම්බන්ධතා ඇති කිරීම සඳහා වඩාත් ගැලපෙන පිරිස හඳුන්වා දෙන්නේ කෙසේ ද?
  - සිරස් සම්බන්ධතා ඇති කිරීම වඩාත් පහසු වන්නේ ඒ ඒ ශ්‍රේණිය, ඒ ඒ වෂර්ය සඳහා තෝරා ගනිමින් ශ්‍රේණි අනුපිළිවෙලින් විෂයමාලා සකස් කරන විෂයමාලා සම්පාදකයින්ටයි.
  - තිරස් සම්බන්ධතා ඇති කිරීම වඩාත් පහසු වන්නේ කිසියම් ශ්‍රේණියක් හා බැඳි පාසල් කාලසටහනක විවිධ විෂය ඉගැන්වීම සඳහා තෝරා ගෙන තිබෙන විෂය ගුරුවරුන්ටයි.
- පාසල් විෂමාලාවක තිරස් සබඳතා ඇති කිරීම ජා.අ.ආ.යේ විෂයමාලා සම්පාදකයින්ට අපහසුවන්නේ ඇයි?
  මේ අය ජා.අ.ආ.යේ ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වන දෙපාතර්මේන්තු රැසක ස්වකීය රාජකාරී කටයුතුවල නිරත වන නිසා
- ඉහත සඳහන් අපහසුතාව ජය ගැනීම සඳහා ජා.අ.ආ. කටයුතු කළ යුත්තේ කෙසේ ද?

- විෂයමාලා සම්පාදන කටයුතුවල නිරත වන ප්‍රධාන අංශ දෙක අතර මනා සම්බන්ධයක් ඇති කළ හැකි පරිදි ජා.අ.ආ යේ සංවිධාන ව්‍යුහය වෙනස් කිරීමෙන්
- අංශ දෙක බාරව සිටින සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනාට ඉහළින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කිරීමෙන්

- පාසල් විෂයමාලාවක තිරස් සම්බන්ධතා ඇති කිරීම පාසල් ගුරුවරුන්ට පහසු කළ හැක්කේ කෙසේ ද?
    - පාසල් වර්ෂයක ආරම්භයේ, වාර්ෂික වැඩ සැලසුම් හා වාර සටහන් සකස් කිරීම සඳහා මොවුන් එක් වන අවස්ථාවේ දී විවිධ විෂය යටතේ එකම මාතෘකා හඳුන්වා දී ඇති අවස්ථා හඳුනාගැනීම
    - සිසුන්ට ගැටලු ඇති නොවන සේ එම විෂය කරුණු සිසුන්ට පවරා දෙන ආකාරය සාකච්ඡා කර ඒ අනුව කටයුතු කිරීම
- පාසල් විෂයමාලාවක සිරස් සම්බන්ධතා ඇති කිරීම සඳහා පාසල් ගුරුවරුන් යොදා ගත හැක්කේ කෙසේ ද?

  කිසියම් මට්ටමකට (උදා: කණිෂ්ට ද්විතීයික) අදාළ, එක ම විෂය ඉගැන්වීම සඳහා එක ම ගුරු පිරිසක් යොදා ගැනීම
- ඉහත ආකාරයට කටයුතු කරන ගුරුවරුන්ට අත්පත් වන වාසි/අවාසි මොනවා ද?
    - අදාළ විෂයය පිළිබඳ මනා පරිචයක් ලබා ගත හැකි වීම නිසා විෂය ආශ්‍රිත ප්‍රබලයෙක් බවට පත් විය හැකි වීම වාසියකි.
    - විවිධ වයස් කාණ්ඩවල පසුවන සිසුන් වෙනුවෙන් හඳුනාගෙන තිබෙන විවිධ විෂය කරුණු, ඒ ඒ කණ්ඩායමට ගැලපෙන අකාරයෙන් ඉගැන්වීම සඳහා සූදානම් වීම වෙහෙසකර විය හැකියි.

<u>**ප්‍රමිති පාදක විෂයමාලා (Standards-Based Curricula) ශ්‍රී ලාංකීය පාසලට හඳුන්වාදීම සඳහා මගපෙන්වා තිබෙන පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව පිළිබඳ වැඩසටහන**</u>

**1.** **පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව** යටතේ හඳුනාගෙන තිබෙන ඇගයීම් ක්ෂේත්‍ර අටෙන් ඕනෑ ම එක් ඇගයීම් ක්ෂේත්‍රයක් තෝරා ගනිමින් එම ක්ෂේත්‍රය යටතේ ප්‍රමිති, නිර්ණායක හා දර්ශක විකාශය වී ඇති ආකාරය පෙන්වා දෙන්නේ කෙසේ ද?

**ඇගයීම් ක්ෂේත්‍රය 5 - ශිෂ්‍ය ශුභසාධනය (Student Welfare)**

**ප්‍රමිතිය** පාසල් දරුවන්ගේ ඉගෙනුමට බාධා කරන විවිධ තත්ත්ව හඳුනාගෙන එම තත්ත්ව ජය ගැනීම සඳහා විවිධ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරයි.

**නිර්ණායකය 1** මූලික අවශ්‍යතා සාක්ෂාත් නොවීමේ (Unmet Basic Needs) හේතුවෙන් දිනපතා පාසල් නොඑන සිසුන් හඳුනාගෙන ඔවුන් වෙනුවෙන් **ශුභසාධන සේවා (Welfare Services)** ක්‍රියාත්මක කරයි.

**දර්ශක**

**1.1** දිනපතා පාසල් නොඑන සිසුන් හඳුනාගෙන, ඔවුන් සමග සාකච්ඡා පවත්වා, පාසල් නොපැමිණීම සඳහා ඔවුන් ඉදිරිපත් කරන හේතු සටහන් කර ගෙන ඇත.

1.2 පාසල් පැමිණීම සම්බන්ධ ව සිසුන් මුහුණදෙන ගැටලුවලට පිළියම් සොයමින් සිසුන්ගේ දෛනික පාසල් පැමිණීම විධිමත් කිරීම සඳහා ව්‍යාපෘති සැලසුම් කර ඇත.

1.3 ව්‍යාපෘති ක්‍රියාවට නැඟීම සඳහා සහාය විය හැකි පරිත්‍යාගශීලීන්, ඔවුන් ලබා දීමට කැමති සහාය ද සමග ලැයිස්තුගත කර ඇත.

1.4 දිනපතා පාසල් එන සිසුන් භුක්ති විඳින වාසි පිළිබඳ ව දෙමාපියන්ට කරන ලද දැනුවත් කිරීම්, පන්ති කව වාතර්ාවලට ඇතුළත් කර ඇත.

**නිණර්ායකය 2** සිසුන්ගේ **කායික සුවතාව (Physical Wellbeing)** තහවුරුකිරීම සඳහා සිසු සෞඛ්‍යය, පෝෂණය හා සනීපාරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වෙයි.

**දශර්ක**

**2.1**සිසු **සෞඛ්‍යය** සුරකීම සඳහා නිතිපතා **සෞඛ්‍ය** සායන (**Health** Clinics) පවත්වමින් ඡායාරූප ද ඇතුළත් වාතර්ා තබා ඇත.

2.2 **පෝෂණ** ව්‍යාපෘති (**Nutrition**al Projects) ක්‍රියාත්මක කරමින් එම වැඩසටහන් වැඩිදියුණු කිරීම සඳහා දෙමාපිය යෝජනා ලබා ගෙන ඇත.

2.3 **පාසල් සනීපාරක්ෂාව, පුද්ගල සනීපාරක්ෂාව හා ආහාර සනීපාරක්ෂාව** (School, Personal and Food **Hygiene**) සුරකින වැඩසටහන් සැලසුම් කර ක්‍රියාවට නඟමින් ප්‍රතිලාභ භුක්ති විඳින පාසල් පිරිස්වල ප්‍රතිචාර සටහන් කර ඇත.

**නිණර්ායකය 3** සිසුන්ගේ **මානසික සුවතාව (Mental Wellbeing)** තහවුරු කිරීම සඳහා ශිෂ්‍ය මාගෙර්ාපදේශන හා උපදේශන සේවා (Guidance & Counselling Services) හඳුන්වා දෙයි.

**දශර්ක**

3.1 ශිෂ්‍ය **මාගෙර්ාපදේශන හා උපදේශන සේවා (Guidance and Counselling)** සැලසුම් කර ක්‍රියාවට නැංවීම සඳහා සුදුසු ගුරු හා කළමනාකරණ පිරිස් හඳුනාගෙන වගකීම් ලිඛිත ව පවරා ඇත.

3.2 ඉහත වැඩසටහන්වල වැදගත්කම හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ ව දෙමාපියන් දැනුවත් කර වාතර්ා තබා ඇත.

3.3 අදාළ ගුරුවරුන්ගේ සහාය ලබමින් 6-9, 10-11 හා 12-13 ශ්‍රේණිවල ඉගෙනගන්නා සිසුන්ගේ හැකියා හා ලැදියා හඳුනාගෙන ඒවා පිළිබඳ ව සටහන් තබා ඇත.

3.4 වෘත්තීය සංවධර්න පාඨමාලා වගර්, එම පාඨමාලා පවත්වන ස්ථාන හා ඒවාට පිවිසිය හැකි ආකාර පිළිබඳ ව තොරතුරු රැස් කර ඇත.

3.5 **ශිෂ්‍ය උපදේශන කටයුතු** සාථර්ක ව ක්‍රියාත්මක කිරීම සඳහා පාසලේ සුදුසු ස්ථානයක් පිළියෙල කර දී ඇත.

3.6 උපදේශන සේවා සපයන්නන් තමන්ට යොමු වූ ගැටලු විසඳීම සඳහා තමන් මැදිහත් වන ආකාර වාතර්ාගත කර ඇත.

**නිණර්ායකය 4** සිසු ඉගෙනුමෙහි ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා **ශිෂ්‍ය සුරක්ෂිතතාව හා ආරක්ෂාව (Safety and Security)** පිළිබඳ සැලකිලිමත් වෙයි.

**දශර්ක**

4.1 **සිසු සුරක්ෂිතතාවට** (safety) හානි එල්ල කළ හැකි තත්ත්ව හඳුනාගැනීම සඳහා පාසල් භූමිය, ගොඩනැඟිලි, උපකරණ, ලී බඩු ආශ්‍රිත සමීක්ෂණ සිදු කර ඇත.

4.2 මත් ද්‍රව්‍ය උවදුරෙන් මෙන් ම ළමා අපචාර / අපයෝජනවලින් පාසල් සිසුන් ආරක්ෂා කර ගැනීම (security) සඳහා පාසල තුළ හා පිටත වැඩිහිටි ප්‍රජාව දැනුවත් කර ඇත.

**නිණර්ායකය 5** ආපදා තත්ත්ව ජය ගැනීම සඳහා සූදානම ප්‍රදශර්නය කරයි.

**දශර්ක** 5.1 අනපේක්ෂිත උවදුරු අවම කර ගැනීම සඳහා **ආපදා කළමනාකරණ වැඩසටහන් (Disaster Management)** සැලසුම් කර, පෙරහුරු පවත්වා, සටහන් ද තබා ඇත.

5.2 ආපදා මෙන් ම ආපදාවලදී සම්බන්ධ කර ගත හැකි ආයතන ද කල් ඇති ව හඳුනා ගෙන වාතර්ා තබා ඇත.

5.3 ආපදා දැන්වීමේ සංඥා ක්‍රමයක් ගොඩ නඟා ඇති අතර එම ක්‍රමය යොදා ගනිමින් ආපදා පෙරහුරු ද පවත්වා වාතර්ා තබා ඇත.

**2. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දශර්කය (School Education Quality Index)** ගණනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු මොනවා ද?

- පාසල් ආශ්‍රිත ඇගයීම සඳහා තෝරා ගෙන තිබෙන **හය ලක්ෂ්‍ය පරිමාණය (Six Point Scale)** සහ
- සමීකරණ දෙක

| | | |
|---|---|---|
| ලකුණු සියයට 80 ට වැඩි | ලකුණු 06යි | විශිෂ්ටයි |
| ලකුණු සියයට 70 - 79 අතර | ලකුණු 05යි | ඉතා හොඳයි |
| ලකුණු සියයට 60 - 69 අතර | ලකුණු 04යි | හොඳයි |
| ලකුණු සියයට 50 - 59 අතර | ලකුණු 03යි | සාමාන්‍යයි |
| ලකුණු සියයට 40 - 49 අතර | ලකුණු 02යි | සංවධර්නය විය යුතුයි |
| ලකුණු සියයට 40ට අඩු | ලකුණු 01යි | ඉතා ඉක්මණින් සංවධර්නය විය යුතුයි. |

$$\text{එක් එක් ඇගයීම් ක්ෂේත්‍රය සඳහා ලබා ගත් ලකුණු ප්‍රතිශත} = \frac{\text{ලබා ගත් ලකුණු සංඛ්‍යාව} \times 100}{\text{ඇගයීම් කළ දශර්කවලට අදාළව ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව}}$$

$$\text{පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දශර්කය (SEQI)} = \frac{\text{ඇගයීම් ක්ෂේත්‍ර සඳහා ලබා ගත් ලකුණු ලකුණු ප්‍රතිශතවල එකතුව}}{\text{ඇගයීම් ක්ෂේත්‍ර සංඛ්‍යාව}}$$

**Productive School**

